WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,576 — 1958 නොවැම්බර් 5 වැනි බදාදා — 5.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**කේ.ඇල් 51 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය වියලි මිරිස්**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ ආහාර පාලක තැන්පත් විල්ප්‍රඩ් ප්‍රැන්සිස් ප්‍රදිනාන්දු වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1958 අගෝස්තු 19 වෙනි දින කේ.ඇල් 47 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 1 වෙනි තීරයෙහි සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උප ලේඛනයෙහි 2 සහ 3 වෙනි තීරයන්හි පිළිවෙළින් සඳහන්, තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුඩ බර රාත්තලක්ද, කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, මේ උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 19 වෙනි දින, කේ. ඇල් 47 වෙනි ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡේදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 3 වැනි දින අ.භා. 1.30 ට කළුතරදී අත්සන් තබන ලදී.

ඩබ්ලිව්. ඇෆ්. ප්‍රදිනාන්දු,
සහකාර මිළ ආහාර පාලක තැන, කළුතර දිස්ත්‍රික්කය.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... ... ... | 88·94 ... | 0·88 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය, මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

3281—ජේ. ඇන්. ආර් 26762—5,932 (11/58)

**ඇප්./සී./ඇම්./13 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කයන්හි සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් වින්සන්ට් ඥන ප්‍රගාසම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) වැනි වගන්තියත් සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව—

(1) 1958 අගෝස්තු 19 දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනලද 1958 අගෝස්තු 18වෙනි දින ඇප්.සී/ඇම්/9 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව එම උපලේඛනයෙහි 3 වෙනි සහ 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දකුගේ වැඩිම තොගවෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිල මේ දන් පටන්, මේ උපලේඛනයේ 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙළින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, 1958 අගෝස්තු 19 වෙනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 18 වෙනි දින ඇප්.සී/ඇම්./9 දරණ ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 1 වැනි දින පෙරවරු 11ට පුත්තලමේදී අත්සන් තබන ලදි.

ජෝන් වින්සන්ට් ඥන ප්‍රගාසම්,
සහකාර මිළ (ආහාර) පාලක තැන, පුත්තලම.

### උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>තොගවෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| (1) දකුණුපිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ ... ... ... ... | වියලි මිරිස් ... | 89 47 ... | 0 89 |
| (2) උඩප්පුව, බත්තුළුඔය සහ පුලිච්චකුලම හැර උතුරුපිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ ... ... | වියලි මිරිස් ... | 89 87 ... | 0 89 |
| (3) පුත්තලම් උප නගර සභාවේ ප්‍රදේශය සහ හලාවත උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයට අයිති උඩප්පුව, බත්තුළුඔය සහ පුලිච්ච කුලම ... ... ... | වියලි මිරිස් ... | 91 66 ... | 0 90 |
| (4) පුත්තලම උප නගර සභාවේ ප්‍රදේශය හැර පුත්තලම් පත්තු සහ ගුැවටිහි ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ ... | වියලි මිරිස් ... | 92 46 ... | 0 90 |
| (5) ඊත්තාලේ සහ ආණමඩුව ... ... ... | වියලි මිරිස් ... | 92 70 ... | 0 90 |
| (6) ඊත්තාලේ හැර කල්පිටිය ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශද ආණමඩුව හැර දෙමළ හත්පත්තු ප්‍රාදේශික ආදායම් නිලධාරි තැනගේ සියලුම ප්‍රදේශ ... ... ... | වියලි මිරිස් ... | 92 94 ... | 0 90 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණ මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**අංක. කේ. යු. 13/58 දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ගාර්දියේ පුංචිහේවාගේ බුද්ධදස ද සිල්වා වන මම, 1950 අංක 29 දරණමිළ ප පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3(2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව,

1. 1958 අගෝස්තු 19 වැනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 අගෝස්තු 15 වැනි දින කේ. යු. 11/58 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උප ලේඛනයේ 2 වැනි 3 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

2. එසේම මීට යා කර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුඞ හො. 1 ක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කුරුණෑගල පැ දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් මේ උප ලේඛනයේ 2 වැනි 3 වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන් තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

3. කවද මෙම නියෝගයේ කාර්ය සඳහා —

(අ) උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උප ලේඛනයේ 1 තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ශුඩ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තො වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) උප ලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රම යක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

4. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම හෝ යම් ස්ථානයක හෝ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

5. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

6. එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

7. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්,

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම් : වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ;

(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය : ඇතුළත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

8. උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත්, උප ලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුලත් වන බවද නියම කරමි.

9. ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

10. චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

11. ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අඩුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

12. ලෑලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

13. මෙම නියෝගය සඳහා " ශුද්ධ " යන්නෙන් හැඟවෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියම කරමි.

1958 නොවැම්බර් මස 3 වැනි දින පූ. භා. 10 ට කුරුණෑගල කච්චේරියේදී අත්සන් කරන ලදී.

ජී. පී. බුද්ධදාස ද සිල්වා,
සහකාර (ආහාර) පාලක තැන.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තර | ශුඞ බර හො. 1 ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රා. 1 ක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| අර්තාපල් ... ... ... | 29 84 ... | 0 32 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එම ද්‍රව්‍ය එකී මිළ ) වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

අංක. කේ. යූ. 14/58 දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ගාර්දියේ පුංචිහේවාගේ බුද්ධදාස ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බල තල අනුව—

(1) 1958 අගෝස්තු 19 වැනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 අගෝස්තු 15 වැනි දින අංක කේ. යූ. 11/58 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව එම උප ලේඛනයෙහි 2 වැනි සහ 3 වැනි තීරයන්හි පිළිවෙළින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) එසේම මීට යා කර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, මේ උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනු පිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව 1958 අගෝස්තු 19 වැනි දින අංක 11,476 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 15 වැනි දින අංක කේ. යූ. 11/58 දරණ ආහාර මිළ නියෝගයේ 3 වැනි ඡෙදයේ සිට 8 වැනි ඡෙදය දක්වා ඇති ඡෙදයන්; මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතු ලෙසද, මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 4 වැනි දින පෙරවරු 10 ට කුරුණෑගල කච්චේරියේ දී අත්සන් තබන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
සහකාර (ආහාර) මිළ පාලක, කුරුණෑගල දිස්ත්‍රික්කය.

### උප ලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය |
|---|---|---|
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හො. 1ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රා. 1ක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... ... ... | 88 49 ... | 0 88 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එම ද්‍රව්‍ය එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**ඇෆ්. සී/වී ඇස්. ඇෆ් 1 (19) දරණ ආහාර මිළ නියෝගය.**

**අතිරේක ආහාර ද්‍රව්‍ය.**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වෙනි ඡෙදය හා 3 (2) වෙනි ඡෙදයන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(1) 1958 අගෝස්තු 20 වෙනි දින, අංක 11,478 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට පත්‍රයෙහි පලකරණ ලද 1958 අගෝස්තු 20 වෙනි දින අංක ඇෆ් සී/වී. ඇස් ඇෆ් 1 (16) දරණ ආහාර මිළ නියෝගයේ ''ඒ'' සහ ''බී'' උප ලෙඛනයන්හි 5 වෙනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව එම උප ලෙඛනයන්හි තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලෙඛනයේ 1 තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභොගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, මේ උපලෙඛනයේ 2 වෙනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිල මේ දැන් පටන්, මේ උපලෙඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලෙඛනයේ සඳහන් වියලි මිරිස් පිළිබඳ 1958 අගෝස්තු මස 20 වෙනි දින අංක 11,478 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට පත්‍රයේ පළකරණ ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 20 වැනි දින අංක ඇෆ් සී/වී. ඇස්. ඇෆ් 1 (16) වෙනි ආහාර මිළ නියෝගයේ 4 සිට 9 දක්වා ඡෙදයන්, මෙම නියෝගයේම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 5 වැනි දින, පෙ. ව. 9.15 ට කොළඹ කච්චේරියේ දී අත්සන් කරණ ලදී.

ඇස්. ජේ. විජේසේකර
(ආහාර) සහකාර මිළ පාලක, කොළඹ දිස්ත්‍රික්කය.

### උප ලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... | 1. හාපිටිගම් කෝරළය ... ... ... | 89 72 ... | 0 86 |
| | 2. අළුත්කුරු කෝරළය. උතුර ''ඒ'' ... ... | 89 46 ... | 0 86 |
| | 3. අළුත්කුරු කෝරළය උතුර ''බී'' ... ... | 89 40 ... | 0 86 |
| | 4. අළුත්කුරු කෝරළය දකුණ ... ... ... | 89 20 ... | 0 86 |
| | 5. සියනෑ කෝරළය නැගෙනහිර ... ... | 89 52 ... | 0 86 |
| | 6. සියනෑ කෝරළය බස්නාහිර (අදිකාරි පත්තුව) ... ... | 89 18 ... | 0 86 |
| | 7. සියනෑ කෝරළය බස්නාහිර (මැද පත්තුව) ... ... | 89 28 ... | 0 86 |
| | 8. හේවාගම් කෝරළය ... ... | 89 36 ... | 0 86 |
| | 9. සල්පිටි කෝරළය ... ... ... | 89 28 ... | 0 86 |
| | 10. කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාවෙන් පිට) ... ... ... | 89 12 ... | 0 85 |

**සැලකිය යුතුයි.**—ඉහත සඳහන් මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.